# අගලවත්ත ප්‍රාදේශීය සභාව
## කළුතර දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණවලින් අයකර තිබූ කැබ් රථයේ ණය වාරික රු.1,059,409 ක් ආදායම් ආධාර ගිණුමට එකතු කළ යුතු වුවත් එම ශේෂය ගිණුමෙන් අඩු කර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ආධාර ශේෂය රු.2,118,818 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.1,364,076 ක් ආදායම් ආධාර ගිණුමට පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය අවසානයට ණයහිමි ගිණුමේ රු.29,575,556 ක් වූ ශේෂය, ශේෂ පිරික්සුමට රු.29,389,071 ක් ලෙස ගෙන තුලනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ණයහිමි ලෙජර ගිණුමේ ආරම්භක ශේෂය ලෙස ඉහත වැරදි ශේෂය දක්වා රු.186,476 ක් එම ගිණුමට එකතු කර තිබුණද ඊට අදාල ප්‍රතිවිරුද්ධ සටහන ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

කේවල ණයහිමි ශේෂ දැක්වෙන උපලේඛණ හෝ ලේඛණ නොමැති වීම නිසා 2013 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු.81,940,449 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.5,277,810 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදයම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.6,465,286 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 2,799 | 2,161 | 952 |
| (ii) බදු කුලී | 2,048 | 1,894 | 155 |
| (iii) බලපත්‍ර ගාස්තු | 137 | 137 | -- |

2.2.2 **වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.912,926 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් 2015 ජුලි 15 දිනට රු.431,892 ක් පමණක් අයකරගෙන තිබූ අතර තවදුරටත් රු.481,034 ක ශේෂයක් අයවීමට තිබුණි.

2.2.3 **අක්කර බදු**

2014 නොවැම්බර් 30 දිනට බදුකරුවන් 41 කගෙන් රු.9,415 ක අක්කර බදු ශේෂයක් හිඟව පැවති අතර ඒ තුළ අවුරුදු 5 හා ඊට වඩා වැඩි කාලයක සිට හිඟව පැවත එන බදුකරුවන් තිදෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.2,276 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේදී සභාවේ උත්සව කටයුතු වෙනුවෙන් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන අමාත්‍යවරයාගෙන් වියදම් සඳහා ලබා ගෙන තිබූ අනුමැතිය ඉක්මවා රු.180,500 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 විධිවිධාන ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ලබාදීමේදී කිසියම් නිශ්චිත කාලයක් තුළ සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතු වුවත් ඊට පටහැනිව සමිති දෙකක් වෙත එකම කාලසීමාව තුළ ව්‍යාපෘති 05 ක් හා 04 ක් ලබා දී තබුණි.

3.3 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවලට බලතල පවරාදීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටිය ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු එක් ව්‍යාපාර ස්ථානයක් සඳහා 2012 වර්ෂයේ සිටද, තවත් ව්‍යාපාර ස්ථාන

02 ක් සඳහා 2013 වර්ෂයේ සිටද තවත් ව්‍යාපාර ස්ථානයක් සඳහා 2014 වර්ෂය සඳහාද පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ඇ) සභාවේ සභපතිවරයා සහ මන්ත්‍රීවරු 8 දෙනෙකු විදේශ අධ්‍යයන චාරිකාවක් සඳහා සහභාගි වී තිබූ අතර ඒ සඳහා සභා අරමුදලින් රු.1,357,710 ක් වැය කර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් විදේශ ගමන් සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

(ii) ප්‍රතිපාදන වෙන් කර නොතිබීම නිසා ඉහත විදේශ ගමන් වියදම මන්ත්‍රී සංවර්ධන යෝජනා වැය විෂයයෙන් දරා තිබුණද එම වැය විෂයයේද එදිනට ඉතිරි වී තිබූ ප්‍රතිපාදන රු.1,007,675 ක් විය. මේ නිසා ප්‍රතිපාදන ඉක්මවා රු.350,035 ක් වැය කර තිබූ අතර ඉහත වියදම් දැරීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතිවල II වන පරිච්ඡේදයේ 14 ඡේදයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ශේෂය රු.43,795 ක් සහ එකතු කළ අගය මත බදු ශේෂය රු.754,610 ක් සමාලෝචිත වර්ෂය අවසානයට වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වැය පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) ව්‍යාපෘති පරිපාලනය